# පුරුදු සද්දයක්



ඊශාන් කේ පොන්සේකා

# පුරුදු සද්දයක්

ඒශාන් කේ පොන්සේකා

කතෘ

පළමු දිගහැරුම

මහ/කිංස්වුඩ් විදුහල

3 ශ්‍රේණිය

2025.02.08

ISBN – 978-624-208-749-8

# පිදුම

## කුරුල්ලන්ට ආදරේ කරන මගේ යහළුවන්ට

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමය අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛබ සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හදුනාගනිමින් ලේඛණ කරණයට යොමුවීම ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

# පටුන

- ❖ හැඳින්වීම
- ❖ ක්‍රමවේදය
- ❖ නිරීක්ෂණ
- ❖ නිගමන
- ❖ මා සිටවූ පැළය

❖ හැඳින්වීම

විවේක වේලාවට කුරුල්ලන් ගැන සොයා බැලීම නිසා තමයි මම මේ හැදෑරීම කලේ.

❖ ක්‍රමය

මාසයක් තිස්සේ කොහාව නිරීක්ෂණය කිරීම.

❖ යොදාගත් උපකරණ

දුරදක්නය

❖ තොරතුරු සොයාගත් හැටි

- සරත් කොටගම සීයාගේ **Birdguide** පොත
- අත්තම්මාගෙන්
- අන්තර්ජාලයෙන්

# පුරුදු සද්දයක්

දිනය 2022.02.26 ස්ථානය ගෙවත්ත


කාලය උදේ 6.00 කාලගුණය ඉර හොඳට පායලා



උදේ මම නැගිටින්න යද්දි කාලෙකින් ඇහුනේ නැති පුරුදු සද්දයක් ඇහුණා. අවුරුදු කාලෙට එන කොහාගේ සද්දේ මම වත්තට ගියා.කවුරුත් පේන්න නැහැ.මම පිටි පස්සේ දොරගාවට ගියා. ගස් අස්සෙන් කුරුල්ලෙක් පෙනුනා.එයා කොහෝ කොහෝ ගෑවා. මමත් කොහෝ කියලා කෑගැහුවා. කොහා ආයෙත් මට කොහෝ කොහෝ ගාලා උත්තර දුන්නා. අවුරුදු කාලයට කියන සිංදුවක් මට මතක් උනා.

# කොහා ගැන කවි, සිංදු

| | | | |
|---|---|---|---|
| දිනය | 2022.02.27 | ස්ථානය | ගෙවත්ත |
| කාලය | ප.ව 5.00 | කාලගුණය | ඉර බැහැලා |


ඇස් රතු පාටයි - ඇඟ කළු පාටයි.
හරිම ලස්සනයි - අහසේ පියාසර කරයි
අවුරුදු කාලෙට එන්නේ
කොහා ගැනයි මං මේ
කථා කරන්නේ.

කොහෝ කොහෝ - කොහෝ ඉදන්

කොහෝ කියනවා දෝ

අපේ ගමේ රබන් පදේ

නුඹට ඇහෙනවාදෝ

මම මේ රතු පාටින් ලිවුවේ මම ම කොහා ගැන හැදුවේ කවියක්

# ගහ උඩ කොහා

දිනය 2022.03.01 ස්ථානය ගිනිහිරියා ගහ උඩ

කාලය පෙ.ව 6.00 කාලගුණය ලා මීදුම



අද නිවාඩු දවසක්.අද මම උදේම නැගිට්ටා. වත්තට ගියා.ගිනිහිරියා ගහ උඩ කොහා හිටියා.මම දුරදක්නය ගෙනවිත් කොහාව බැලුවා.ඊට පස්සේ **Bird guide** පොත අරගෙන අම්මාගේ උදවු ඇතුව කොහාව බැලුවා.

# කොහා

**දිනය** 2022.03.04 **ස්ථානය** ගිනිහිරියා ගහ උඩ

**කාලය** පෙ.ව 7.00 **කාලගුණය** ඉර පායලා



මම දැක්කේ කොහාගේ පිරිමි සතාය.තරමක් ලොකු හා කලුපාට පිහාටුවලින් සිරුර වැසී ඇත. ඇස් රතු පාටය.දිග පෙදයක් ඇත. කහ පාටට හුරු කොළ හොටක් ඇත. පාද අලු පාටය.

# කොහා ගැන විස්තර

දිනය 2022.03.06 ස්ථානය ගෙවත්ත

කාලය ප.ව 5.00 කාලගුණය අඳුරු

මට ප්‍රශ්නයක් ආවා

කොහා ඉන්නේ ලංකාවේ විතරද?

අවුරුදු කාලෙට විතරක් කොහා කෑ ගහන්නේ ඇයි? කියලා මං අම්මාගෙන් ඇහුවා. අම්මයි මමයි **Bird Guide** පොතේ විස්තර හෙව්වා.

ශ්‍රී ලංකාවේ භාවිතා වන නම කොහා කොවුලා

ඉංග්‍රීසි නම **Asian koel**

විද්‍යාත්මක නම **Eudynamys Scolopaceus**

# කුරුළු පොතෙන්

දිනය 2022.03.08 ස්ථානය ගෙවත්ත

කාලය ප.ව 5.00 කාලගුණය පැහැදිලි




## පක්ෂියා හමුවූ ප්‍රදේශය

මහනුවර - ප්‍රිම්රෝස් උයන

හමු වූ කාලය

පෙබරවාරි මාසය - මාර්තු මාසය හා අප්‍රේල් මාසය

කොහාගේ ගැහැණු සතා සහ පිරිමි සතා පෙනුමෙන් වෙනස්ය.

# බාහිර පෙනුම


**හොට හා ඇස**

**හොට කහ පාටට හුරු කොළ**

**ඇස් රතු පාටයි**



**පාද**



**පාද අළු පාටය**

# කෙවිලිය



මම කෙවිලිය දැක්කේ නැති වුණාට විස්තර හොයා ගත්තා.

දුඹුරු පිහාටු වල සුදු තිත් හා ඉරි ඇත. ඇස් රතු පාටය. දිග පෙදයක් ඇත. කහ පාටට හුරු කොළ හොටක් ඇත.පාද අළු පාටය.

# බිත්තර

දිනය 2022.03.23 ස්ථානය අන්තර්ජාලයෙන්

කාලය ප.ව 5.00 කාලගුණය අඳුරු



කොහා කූඩුවක් හදන්නේ නැතුව කම්මැලිකමට කපුටු කූඩුවල බිත්තර දාන්නේ කියලා අත්තම්මා මට කිවුවා. දුඹුරු පාට ලප තියෙන සුදු බිත්තර

**(මි.මි 31 x 25)**

# කොහාගේ පැටවුන්ට වෙන දේ



පැටවු බිත්තරවලින් එළියට එනවා. කපුටු ජෝඩුව පැටවුන්ට කෑම කවනවා. ටික කාලයක් ගියාම පැටවුන් හඩලනවා. එතකොට දැනගන්නවා කොහාගේ  පැටවුන් ඉන්නවා කියලා කපුටු ජෝඩුව ඔවුන්ව කූඩුවෙන් පන්නනවා.

## නිගමන

- කොහාගේ පිරිමි සතා කලුපාටය.
- කොහාගේ පිරිමි සතා හා ගැහැණු සතා පෙනුමෙන් වෙනස් ය.
- පිරිමි සතාට ඇත්තේ කොහෝ නාදයයි.
- කොහා සංචාරක කුරුල්ලෙකි. ඒකයි අවුරුදු කාලෙට සද්දේ ඇහෙන්නේ
- කොහා කපටි කුරුල්ලෙකි.

එයාගේ පාටම කපුටන්ගේ කූඩු වලයි බිත්තර දාන්නේ

## නිරීක්ෂණයේ දී මට ආව ප්‍රශ්න හා පිළිතුරු

- ❖ ඇයි කොහා අවුරුදු කාලයට විතරක් එන්නේ?
- ❖ කොහා සංචාරක කුරුල්ලෙක් නිසා

- ❖ කොහා උස ගස්වල ඉන්නකොට මට හොදට පෙනුනේ නෑ. මේ සදහා මම දුරදක්නය පාවිච්චි කළා.

- ❖ කොහා හා ගැන හොයන්න හා බලන්න යද්දි නොසිටීම.කොහාගේ සද්දේ ඇහෙද්දී ගොස් නිරීක්ෂණය කිරීම.
- ❖ කොහාව නිරීක්ෂණය කරන්න යද්දි ඉගිලයාම.දුරක සිට දුරදක්නයෙන් බැලීම.
- ❖ කොහාගේ කූඩුව, බිත්තර හා පැටවු නොසිටීම.ඔවුන් ගැන පොත්වලින් සොයා බැලීම.

මෙමගින් මා ඉගෙනගත් දේ හා අනාගතයේ කිරීමට බලාපොරොත්තු වන දේ

මා ඉගෙන ගත් දේ.

- ❖ කුරුල්ලන්ගේ හැසිරීම ගැන දැන ගැනීම.
- ❖ කරන්න දෙයක් නැතුව ඉන්න වෙලාවට පරිසරයේ ලස්සන බැලීමට හැකි බව.
- ❖ ඈත හොදට පේන්නේ නැති දේ බැලීම සදහා දුරදක්නය යොදා ගත හැකි බව.

අනාගතයේ කිරීමට බලාපොරොත්තු වන දේ

- ❖ කොහාගේ බිත්තර හා පැටවු ගැන හොයා බැලීම.
- ❖ කුරුලු උයනකට ගොස් තවත් කුරුල්ලන් ගැන විස්තර සෙවීම.
- ❖ බිම වැටුණු පිහාටු එකතු කිරීම.
- ❖ කුරුල්ලන්ට ගෙඩි කන්න ගස් හිටවීම.

මා වැවූ ගස

නම පැණි දොඩම්

විද්‍යාත්මක නම **Citrus Sinessis**

## ගසෙන් ඇති ප්‍රයෝජන

- ගෙඩි ආහාරයට ගත හැකි වීම.
- ඔක්සිජන් වායුව ලබා දීම.
- අපිට සිසිලසක් ලබා දීම.

පැළ කිරීම.



රුක බලා ගැනීම.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගතපරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට ඇවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහි දී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මකබවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත් මහලේකම්